*සැ. යු.*-2014.11.28 දින පළ වූ අංක 1,891 දරන *ගැසට් පත්‍රයේ* I:III සහ II කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,892 - 2014 දෙසැම්බර් මස 05 වැනි සිකුරාදා - 2014.12.05**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 2160 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 2163 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 දෙසැම්බර් මස 26 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 දෙසැම්බර් මස 12 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (*වැ. බ.*).

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2157- B 80898—2,875 (2014/11)
B1-

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරීත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක වක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කැලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු — ඇබෑර්තු

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### අංක 888/2 දරන 1995.09.12 දිනැති ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවා ව්‍යවස්ථාවේ 9.0 වගන්තිය යටතේ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ I පන්තියේ පුරප්පාඩු පිරවීම

අංක 888/2 දරන 1995 සැප්තැම්බර් මස 12 දිනැති *ගැසට් පත්‍රයේ* පළ කරන ලද, 1995.01.01 දින සිට බලාත්මක ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 9.0 වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ I පන්තියේ (අධි සේවක) හා II පන්තියේ I ශ්‍රේණියේ නිලධාරීන් ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ I පන්තියේ පුරප්පාඩු පවතින පහත සඳහන් තනතුරුවලට පත් කිරීම සඳහා 2013.04.01 දිනට නියමිත සුදුසුකම් සපුරා ඇති නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. පුරා විද්‍යා දෙපාර්තමේන්තුව (අධ්‍යක්ෂ, වාස්තු විද්‍යා සංරක්ෂණ) - තනතුරු 01
2. ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව (අධ්‍යක්ෂ, වාස්තු විද්‍යා) - තනතුරු 01
3. ගොඩනැගිලි දෙපාර්තමේන්තුව (ජ්‍යෙෂ්ඨ වාස්තු විද්‍යාඥ) - තනතුරු 02
4. ගොඩනැගිලි දෙපාර්තමේන්තුව (අධ්‍යක්ෂ, වාස්තු විද්‍යාඥ සේවා) - තනතුරු 01

01. *උසස් කිරීම සඳහා සපුරාලිය යුතු සුදුසුකම් :*

(i) 2013.04.01 දිනට ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ I පන්තියේ (අධි සේවක) හෝ II පන්තියේ I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම.
(ii) 2013.04.01 දිනට පූර්වාසන්න වසර 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

02. *තනතුරු සඳහා උසස් කිරීමේ ක්‍රමය :*

2013 අප්‍රේල් මස පළමු (01) දින වන විට 1995 සැප්තැම්බර් 12 දිනැති *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 9.0 වගන්තිය ප්‍රකාරව, ඉහත සුදුසුකම් සම්පූර්ණ කරන ලද නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර පුරප්පාඩු සඳහා සුදුසු නිලධාරීන් පත් කිරීම සිදු කරයි. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනය තීරණය කරනුයේ රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම් විසිනි.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු පරිපාටිය පහත පරිදි වේ.

2013.04.01 දිනට සපුරා ඇති සුදුසුකම් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.

| *පරීක්ෂා කර ලකුණු ලබා දෙන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *මුළු ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 01. ජ්‍යෙෂ්ඨතාවය | | 50 |
| ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ II/I ශ්‍රේණියේ,<br>01.1. වසරක කාලසීමාවක් සඳහා ලකුණු 06 බැගින් (මාස 02ක සේවා කාලයක් සඳහා ලකුණු 01 බැගින්) | 50 | |
| 02. කුසලතාවය - වාස්තු විද්‍යාඥ ක්ෂේත්‍රයට දක්වන ලද දායකත්වය | | 50 |
| 02.1 පශ්චාත් උපාධිය<br>-විද්‍යාපති උපාධිය<br>- දර්ශනපති උපාධිය<br>මෙම උපාධි සුදුසුකම් දෙකම සහිත නිලධාරීන්හට උපරිම ලකුණු 30යි. | <br>10<br>20 | |
| 02.2 වාස්තු විද්‍යාඥයෙකු වශයෙන් වාස්තු විද්‍යා අධ්‍යාපනය හා වෘත්තීය නගා සිටුවීම පිළිබඳව දක්වන ලද දායකත්වය | | |
| 02.2.1 ක්ෂේත්‍රයට අදාලව ඉදිරිපත් කරන ලද ප්‍රකාශන 1ට ලකුණු 02 බැගින් | 06 | |
| 02.2.2 වාස්තු විද්‍යාවට අදාල දේශීය/විදේශීය පිළිගත් ආයතනයක දරන ලද තනතුරු 1ට ලකුණු 02 බැගින් | 06 | |
| 02.2.3 වාස්තු විද්‍යාඥ ක්ෂේත්‍රයට අදාලව ඉටු කරන ලද විශේෂ රාජකාරී සම්බන්ධයෙන් ලද ප්‍රශංසා/සම්මාන 1ට ලකුණු 01 බැගින් | 03 | |
| 03. සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය | 05 | |
| මුළු ලකුණු | | 100 |

03. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා ලද ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව උපරිම ලකුණු ලබා ගත් නිලධාරීන් පුරප්පාඩු තනතුරුවලට පත් කරනු ලබන අතර පත් කරනු ලබන සංඛ්‍යාව, පත්වීම ක්‍රියාත්මක වන දිනය, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග අනුව තීරණය කරනු ලබයි.

04. රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලටද, ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවා ව්‍යවස්ථාවේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලටද, (ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 888/2 දරන 1995 සැප්තැම්බර් මස 12 දිනැති ගැසට් පත්‍රයේ පළ කරන ලද) එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතු කෙරෙන හෝ සංශෝධනවලටද යටත්ව, තෝරා ගනු ලබන නිලධාරීන් ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ 1 පන්තියේ පුරප්පාඩු පවතින ඉහත තනතුරු සඳහා පත් කරනු ලැබේ.

05. 2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 ප්‍රකාරව, ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයට අදාල වැටුප් පරිමාණය (මාසික) රු. 22,935-10x645-8x790-17x1050-රු. 53,555ක් වන අතර, උසස්වීම් දින සිට ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ 1 පන්තියට අයත් රු. 36,755 ක (මාසික) ආරම්භක වැටුප් පියවරේ පිහිටුවනු ලැබේ.

06. පහත ආකෘතිය අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු ඉදිරිපිට අත්සන් කර එම අත්සන දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් සහතික කර දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශයද සහිතව, ලියාපදිංචි තැපෑලෙන් 2015 ජනවාරි මස 05 දිනට හෝ එදිනට පෙර ලැබෙන පරිදි "කොළඹ 07, නිදහස් චතුරශ්‍රය, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ, ලේකම්" වෙතට එවිය යුතුය. අයදුම්පත්‍රය බහා ඇති කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි "ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ I පන්තියේ පුරප්පාඩු පිරවීම" යන වචනය පැහැදිලි ලෙස ලිවිය යුතුය. එදිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පතක් භාර නොගන්නා අතර අයදුම්පත අස්ථානගතවීම හෝ ප්‍රමාදවීම සම්බන්ධයෙන් පැමිණිලිද භාර ගනු නොලැබේ.

07. මෙම නිවේදනයෙහි සිංහල, දෙමළ, ඉංග්‍රීසි පිටපත්වල කරුණු අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් සිංහල පිටපත බලාත්මක වේ.

08. අයදුම්පත්‍රය www.pubad.gov.lk ඔස්සේද ලබා ගත හැකිය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

පී. බී. අබේකෝන්,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

**අංක 888/2 දරන 1995.09.12 දිනැති ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවා ව්‍යවස්ථාවේ 9.0 වගන්තිය යටතේ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ I පන්තියට පත් කිරීම සඳහා අයදුම්පත්‍රය**

01. (i) (අ) අගට යෙදෙන නම මුලකුරු සමඟ (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

| | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | |

(ආ) අගට යෙදෙන නම මුලකුරු සමඟ (සිංහලෙන්/දෙමළෙන්) :————.

(ii) (අ) මුලකුරු වලින් කියවෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

| | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | |

(ආ) මුලකුරු වලින් කියවෙන නම් (සිංහලෙන්/දෙමළෙන්) :————.

02. උපන් දිනය : වර්ෂය මාසය දිනය

| වර්ෂය | | | | මාසය | | දිනය | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

03. ජාතික හැඳුනුම්පත් අංකය :

04. (i) ස්ථිර ලිපිනය : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

(ii) දුරකථන අංකය : ජංගම :

නිවස :

05. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :

| අනු. අංකය | අධ්‍යාපන සුදුසුකම් | සුදුසුකම් සම්පූර්ණ කළ වර්ෂය | ආයතනය |
|---|---|---|---|
| 01 | පූර්ණ වෘත්තීය සුදුසුකම | | |
| 02 | විද්‍යාපති උපාධිය | | |
| 03 | දර්ශනපති උපාධිය | | |
| 04 | වෙනත් | | |

06. සේවා පළපුරුද්ද :

(i) ලකුණු පරිපාටියෙහි 02.2.2 යටතේ වාස්තු විද්‍යාවට අදාළව දේශීය/විදේශීය පිළිගත් ආයතනයක දරන ලද තනතුරු :————.

(ii) ලකුණු පරිපාටියෙහි 02.2.1 යටතේ ක්ෂේත්‍රයට අදාළව ඉදිරිපත් කරන ලද ප්‍රකාශන :————.

07. (i) ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ I පන්තියට පත්වූ දිනය : අවුරුද්ද : මාසය : දිනය :

(ii) ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ II පන්තියේ I ශ්‍රේණියට පත් වූ දිනය අවුරුද්ද : මාසය : දිනය :

(iii) 2013.04.01 වැනි දින වන විට ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ II/I ශ්‍රේණියේ සේවා කාලය : අවුරුදු : මාස : දින :

08. වර්තමාන සේවා ස්ථානය හා දැනට දරන තනතුර :————.

09. (i) 2013.04.01 වැනි දිනට පූර්වාසන්න වසර 05ක සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබේද ? ඔව් නැත

(ii) 2013.04.01 වැනි දිනට පූර්වාසන්න වසර 05ක සේවා කාලය තුළදී විනයානුකූල දඬුවමකට යටත් කොට තිබේද? ඔව් නැත

(iii) දැනට විනයානුකූල පරීක්ෂණ කිසිවක් පැවැත්වේද? ඔව් නැත

10. මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය බවත්, සැපයිය යුතු තොරතුරු දී ඇති උපදෙස් පරිදි සම්පූර්ණ කර නොතිබීම, අසම්පූර්ණ වීම, අසත්‍ය වීම සහ අයදුම්පත නියමිත දිනට හෝ එදිනට පෙර රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත භාර නොදීම මත මාගේ අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප වීමට හේතු විය හැකි බවත්, පුරප්පාඩු තනතුරකට මා පත් කර ගැනීමෙන්

පසුව වුවද මෙහි ඇතුළත් යම් තොරතුරක් වැරදි හෝ අසත්‍ය බව දැන ගැනීමට ලැබුනහොත් එය තනතුර අහිමිවීමට හේතු විය හැකි බවත් හොඳින් ම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

11. ඉහත 1 සිට 10 දක්වා වූ තොරතුරු නිවැරදි බවත්, මෙම නිලධාරියා/නිලධාරිනිය සම්මුඛ පරීක්‍ෂණයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලබා ඇති බවත් සහතික කරමි. තවද නිලධාරියා/නිලධාරිනිය පුරප්පාඩු තනතුරක් සඳහා තේරී පත්වුවහොත් දැනට දරන තනතුරෙන් ඔහු/ඇය මුදාහැරිය හැකිය/නොහැකිය.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා පදවි නාමය.

දිනය :————.

12-197

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**උසස් අධ්‍යාපන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනය

**උසස් තාක්‍ෂණ ආයතන සඳහා සිසුන් ඇතුළත් කිරීම - 2015 අධ්‍යයන වර්ෂය**

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) මගින් මෙහෙයවන උසස් ජාතික ඩිප්ලෝමා සඳහා 2013 වර්ෂයේ හෝ ඊට පෙර වර්ෂවල අ.පො.ස. (උ. පෙළ) සමත් අදාළ සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

*අයැදුම්පත් :*

ආදර්ශ අයැදුම්පත්‍රයට අනුව සකස්කර ගන්නා ලද අයැදුම් පත්‍රයක් ඉංග්‍රීසියෙන් සම්පූර්ණ කර රුපියල් පන්සීයක (රු. 500) ක මුදලක් ඕනෑම මහජන බැංකු ශාඛාවක් මගින් අංක 025-2-001-1-3397613 දරන ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතන ගිණුමට බැරකොට ලබාගන්නා ලද කුවිතාන්සිය අයදුම්පතේ අලවා ඔබගේ අයැදුම්පත ඔබ තෝරා ගත් පාඨමාලා පැවැත්වෙන උසස් තාක්‍ෂණ ආයතනයට හෝ උසස් තාක්‍ෂණ ආයතන අංශයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයෙහි වම් පස ඉහළ කෙළවරෙහි ඔබ විසින් අයැදුම් කරනු ලබන පාඨමාලාවේ නම සඳහන් කළ යුතුය. එක් ආයතනයකට වඩා අයැදුම් කරන්නේ නම් අයැදුම් කරනු ලබන සෑම අයැදුම් පත්‍රයක් සඳහාම වෙන වෙනම රුපියල් පන්සියයක (රු. 500) ක වටිනාකමකින් යුත් කුවිතාන්සි සමගින් අයැදුම්පත් ඉදිරිපත් කළ යුතුය. උක්ත අංක දරන ගිණුමට හැර වෙනත් ගිණුම්වලට බැරකරන ලද කුවිතාන්සි සහිත අයැදුම්පත් හා අසම්පූර්ණ අයැදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

අයැදුම්පත් භාරගන්නා අවසන් දිනට 2014.12.31 පසුව ලැබෙන අයැදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

"ආ" කොටසෙහි ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනයට අයත් උසස් තාක්‍ෂණ ආයතන/ආයතන අංශවල පවත්වනු ලබන පාඨමාලා හා ලිපිනයන් දක්වා ඇති අතර, අයැදුම්කරුවන් තම සුදුසුකම් හා සරිලන පාඨමාලා තෝරාගත යුත්තේ "අ" කොටසෙහි සඳහන් පාඨමාලා ලැයිස්තුව තුලිනි.

*දේශන පැවැත්වෙන ආකාරය :*

පූර්ණකාලීන පාඨමාලා සඳහා දේශන සතියේ දිනවල දිවා කාලයේ ද, අර්ධකාලීන පාඨමාලා සඳහා දේශන සති අන්තයේ දිවා කාලයේ ද පැවැත්වේ. සියලුම පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ. අර්ධකාලීන පාඨමාලා අදාළ ක්ෂේත්‍රයේ රැකියාවන්හි නියුක්ත අයට පමණක් සීමා කෙරේ.

*පාඨමාලා ගාස්තු :*

පූර්ණ කාලීන (Full Time) පාඨමාලා සඳහා ගාස්තු අය කරනු නොලැබේ. අර්ධකාලීන (Part-time) පාඨමාලා සඳහා සමාසික ගාස්තු (Semester) පහත පරිදි වේ. :

| | |
|---|---|
| උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා - උ. ජා. ග. ඩි. | රු. 5,000 |
| උසස් ජාතික ඉංග්‍රීසි පිළිබඳ ඩිප්ලෝමා - උ. ජා. ඉ. ඩි. | රු. 8,000 |
| උසස් ජාතික තොරතුරු තාක්‍ෂණ ඩිප්ලෝමා - උ. ජා. තො. තා. ඩි. | රු. 12,000 |

*සම්මුඛ පරීක්ෂණය :*

සුදුසුකම් අනුව තෝරාගත් අයදුම්කරුවන් අභියෝග්‍යතා පරීක්ෂණයකට හා/හෝ සම්මුඛ පරීක්‍ෂණයකට පෙනී සිටිය යුතු ය. ශිෂ්‍යයන් තෝරාගැනීම මූලිකව උසස් පෙළ විභාගයේ දී ලබාගත් ඒකාබද්ධ ලකුණු හෝ Z-score මත පදනම් වේ. සම්මුඛ පරීක්‍ෂණය සඳහා දිනය, වේලාව, ස්ථානය හා ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන ආදී විස්තර අදාළ ආයතන ප්‍රධානීන් විසින් ලිපියකින් පෞද්ගලිකව දන්වා එවනු ඇත. අවශ්‍ය මුල් පිටපත් සම්මුඛ පරීක්‍ෂණයේදී ඉදිරිපත් කළ යුතුය. සහතිකවල මුල් පිටපත් නොමැති අවස්ථාවල දී සහතික කරන ලද ඡායාපිටපත්, ලියාපදිංචිවීමේ දී මුල් පිටපත් ඉදිරිපත් කරන කොන්දේසිය යටතේ භාරගනු ලැබේ.

*නේවාසික පහසුකම් :*

දෙහිවල හා නයිවල උසස් තාක්ෂණ ආයතනවල සීමිත කාන්තා නේවාසිකාගාර පහසුකම් සහ අම්පාර හාඩි උසස් තාක්ෂණ ආයතනයේ හා මට්ටක්කුලිය උසස් තාක්‍ෂණ ආයතනයන්හි සීමිත කාන්තා/පිරිමි

නේවාසිකාගාර පහසුකම් ඇත. මෙම සීමිත පහසුකම් ලබාදෙනුයේ පූර්ණ කාලීන පාඨමාලා සඳහා ලියාපදිංචි වූ සුදුසුකම්ලත් සිසුන්හට පමණි.

එක් එක් පාඨමාලාවන් සඳහා ඇතුළත් වීමට අවශ්‍ය සුදුසුකම් :

"අ" කොටස

01. **උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා (උ. ජා. ඉ. ඩි.) - සිවිල් (පූර්ණ කාලීන) - කාලය වසර 3 1/2යි.**

**උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා (උ. ජා. ඉ. ඩි.) - විදුලි (පූර්ණ කාලීන) - කාලය වසර 3 1/2 යි.**

**උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා (උ. ජා. ඉ. ඩි.) - යාන්ත්‍රික (පූර්ණ කාලීන) - කාලය වසර 3 1/2 යි**
**(සිවිල්/විදුලි/යාන්ත්‍රික ඉංජිනේරු)**

**උසස් ජාතික ගොඩනැගිලි සේවා ඉංජිනේරු ඩිප්ලෝමා (උ. ජා. ගො. සේ. ඉ. ඩි.) - (පූර්ණ කාලීන) - කාලය වසර 3 1/2 යි.**

**උසස් ජාතික ප්‍රමාණ හා මිනුම් සමීක්ෂණ ඩිප්ලෝමා (පූර්ණ කාලීන) (උ. ජා. ප්‍ර. මි. ස. ඩි.) - කාලය වසර 2 1/2 යි.**

*අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය :-*

(i) අ. පො. ස. (උ/පෙළ) ගණිතය විෂය ධාරාව යටතේ විෂයයන් තුනම එක්වරකදී සමත්ව තිබීම ;

*සහ*

අ. පො. ස. (සා/පෙළ) ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාර්ථයක් ලබා තිබීම.

02. **උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා - උ. ජා. ග. ඩි (පූර්ණ කාලීන) - කාලය වසර 4 යි.**

*අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් අතුරෙන් එකක් සපුරා තිබිය යුතු ය. :-*

(i) අ. පො. ස. (උ/පෙළ) විභාගය යටතේ ව්‍යාපාර සංඛ්‍යානය හෝ සංයුක්ත ගණිතය හෝ ගිණුම්කරණය විෂයය ඇතුළත්ව විෂයයන් තුනම එක්වරක දී සාමාර්ථය ලබා තිබීම, මෙම විෂයයන් තුනෙන් විෂයයන් දෙකකට සම්මාන ලබා තිබිය යුතු ය.

අ. පො. ස. (උ./පෙළ) විභාගයේ දී ව්‍යාපාර සංඛ්‍යානය හෝ සංයුක්ත ගණිතය හෝ ගිණුම්කරණය විෂයයන්ට සම්මාන සාමාර්ථයක් ලබා නැත්නම් අ. පො. ස. (සා. පෙ.) විභාගයේ දී ගණිතය විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතු ය.;

*හෝ*

(ii) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ගණක ශිල්පීය ජාතික සහතිකය සමත්වීම;

*සහ*

අ. පො. ස. (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබිය යුතු ය.

2. 1 **උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා - උ. ජා. ග. ඩි (අර්ධ කාලීන) - කාලය වසර 4 යි.**

*අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් අතුරෙන් එකක් සපුරා තිබිය යුතුය. :*

(i) අ. පො. ස. (උ/පෙළ) විභාගය (පැරණි නිර්දේශය) යටතේ එක් අවස්ථාවක දී විෂයයන් හතරකින් හෝ (නව නිර්දේශය) යටතේ එක් අවස්ථාවක දී විෂයයන් තුනකින් සමත් වී තිබීම;

*හෝ*

(ii) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ගණක ශිල්පීය ජාතික සහතිකය සමාර්ථයක් ලබා තිබීම;

*හෝ*

(iii) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ව්‍යාපාර අධ්‍යයන ජාතික සහතිකය (ගණකාධිකරණය) සාමාර්ථයක් ලබා තිබීම හෝ ගණකාධිකරණය පිළිබඳ ජාතික සහතිකය සාමාර්ථයක් ලබා තිබීම;

*සහ*

*ප්‍රායෝගික පළපුරුද්ද* - අයදුම්කරු රජයේ, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ රැකියාවක නිරතව සිටින අයෙකු විය යුතු ය.

පහත සඳහන් සුදුසුකම් දරන්නන් උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාවේ ප්‍රථම වසරින් නිදහස් කර එහි II වසරට බඳවා ගැනීම සෙසු අවශ්‍යතාවන් සපුරාලීමේ හා ඉඩකඩ තිබීමේ කොන්දේසියට යටත්ව අනුමත කර ඇත.

(i) ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය මගින් හෝ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ව්‍යාපාර අධ්‍යයන පිළිබඳ ජාතික ඩිප්ලෝමාව/ව්‍යාපාර මූල්‍ය සමත්ව තිබීම;

(ii) ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය මගින් පවත්වනු ලබන උසස් ජාතික ව්‍යාපාර පරිපාලනය/ව්‍යාපාර මූල්‍ය/කළමනාකරණ ඩිප්ලෝමාව සමත්ව තිබීම;

(iii) ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය මගින් හෝ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන උසස් ජාතික වාණිජ ඩිප්ලෝමාවේ දෙවන වසර සමත්ව තිබීම;

(iv) අදාළ ක්ෂේත්‍රයේ විශ්වවිද්‍යාල උපාධිය (ගණකාධිකරණ/ ව්‍යාපාර පරිපාලන/අලෙවි කළමනාකරණ/ මානව සම්පත් කළමනාකරණ/ ව්‍යාපාර මූල්‍ය/ව්‍යාපාර ආර්ථික විද්‍යා);

(v) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ මධ්‍ය පරීක්ෂණය සමත්ව තිබීම;

(vi) වරලත් කළමනාකාරිත්ව ගණකාධිකරණ ආයතනයේ I සහ II පරීක්ෂණය සමත්ව තිබීම;

(vii) ශ්‍රී ලංකා ගිණුම්කරණ ශිල්පීය ආයතනයේ III අදියර පරීක්ෂණය සමත්ව තිබීම;

(viii) සහතිකලත් කළමණාකරන ගණකාධිකාරි ආයතනයේ අවසාන විභාගය සමත්ව තිබීම.

**03. උසස් ජාතික කළමනාකරණ ඩිප්ලෝමා - උ. ජා. ක. ඩි (පූර්ණ කාලීන) - කාලය වසර 3 යි.**

*සහ*

**උසස් ජාතික සංචාරක හා සත්කාරක කළමනාකරණ ඩිප්ලෝමා - උ. ජා. ස. ස. ක. ඩි. (පූර්ණ කාලීන) - කාලය වසර 3 යි.**

*අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් අතුරෙන් එකක් සපුරා තිබිය යුතුය. :-*

(i) ඕනෑම විෂය ධාරාවකින් අ. පො. ස. (උ/පෙළ) විභාගය එක් වරක දී සියලුම විෂයයන්ගෙන් සමත්වීම;
(ගණිතය, ජීවවිද්‍යාව සහ වාණිජ්‍යය යන විෂය ධාරාවන් යටතේ නම් වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.)

*හෝ*

(ii) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීම් දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ගණක ශිල්පීන් සඳහා වූ ජාතික සහතික පත්‍රය හෝ රාජ්‍ය පරිපාලනය හෝ අලෙවිකරණය සඳහා වූ ව්‍යාපාර අධ්‍යයන ජාතික සහතිකය සමත්වීම;

*සහ*

අ.පො.ස. (සා.පෙ.) විභාගයේ දී ගණිතය හා ඉංග්‍රීසි භාෂාවට සාමාර්ථයක් ලබා තිබීම.

**04. උසස් ජාතික ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමා - උ. ජා. ව්‍යා. ප. ඩි. (පූර්ණ කාලීන) — කාලය වසර 2 1/2 යි.**

*අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් අතුරෙන් එකක් සපුරා තිබිය යුතුය. :-*

(i) අ. පො. ස. (උ/පෙළ) විභාගය වාණිජ්‍යය විෂය ධාරාවෙන් එක්වරකදී සමත් වීම.

*හෝ*

(ii) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ගණක ශිල්පීන් සඳහා වූ ජාතික සහතිකය සමාර්ථයක් ලබා තිබීම;

*සහ*

(iii) අ. පො. ස. (සා./පෙ.) විභාගය සඳහා ඉංග්‍රීසි භාෂාව විෂයට හා ගණිතය විෂයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**05. උසස් ජාතික තොරතුරු තාක්‍ෂණ ඩිප්ලෝමා - උ. ජා. තො. තා. ඩි. (පූර්ණ කාලීන - කාලය වසර 2 1/2යි) අර්ධ කාලීන - කාලය වසර 2 1/2යි)**

*අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු ය. :-*

(i) අ. පො. ස. (උ/පෙළ) විභාගය ඕනෑම විෂය ධාරාවකින් එක් වරකදී සමත්ව තිබීම.

(ගණිතය, ජීව විද්‍යාව සහ වාණිජ්‍යය යන විෂය ධාරාවන් යටතේ නම් වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.);

*සහ*

අ.පො.ස. (සා.පෙළ.) විභාගය සඳහා ඉංග්‍රීසි භාෂාව විෂයට හා ගණිතය විෂයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

*සැලකිය යුතුයි :-*

(අර්ධ කාලීන සිසුන් සඳහා පමණක්), තොරතුරු තාක්‍ෂණ ක්‍ෂේත්‍රය සම්බන්ධ රැකියාවක නිරත විය යුතුය.

**06. උසස් ජාතික තාක්ෂණික ඩිප්ලෝමා (කෘෂිකර්මය) - උ. ජා. තා. ඩි. (කෘෂි) (පූර්ණ කාලීන) - කාලය වසර 2 1/2 යි.**

*අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු ය :-*

(i) එක් වතාවකදී අ.පො.ස. (උ./පෙළ.) විභාගය යටතේ ජීව විද්‍යා අංශයෙන්, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව, ජීව විද්‍යාව, භෞතික විද්‍යාව යන විෂයයන් අතරින් දෙකක් සහිතව විෂයයන් තුනකින් එකවර සමත්වී තිබීම;

*සහ*

(ii) අ.පො.ස. (සා./පෙළ.) විභාගයේ දී ඉංග්‍රීසි භාෂා විෂයට හා ගණිතය විෂයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**07. උසස් ජාතික ඉංග්‍රීසි පිළිබඳ ඩිප්ලෝමා - උ. ජා. ඉ. ඩි. (පූර්ණ කාලීන - කාලය වසර 2 1/2/අර්ධ කාලීන - කාලය වසර 2 යි.)**

*අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් අතුරෙන් එකක් සපුරා තිබිය යුතුය. :-*

(i) අ. පො. ස. (උ/පෙළ) විභාගය ඕනෑම විෂය ධාරාවකින් එක්වරක දී සමත්ව වී තිබීම සහ අ. පො. ස. (සා/පෙළ) විභාගයේදී ඉංග්‍රීසි සාහිත්‍ය හෝ ඉංග්‍රීසි භාෂාව විෂයය සඳහා "C" සාමාර්ථයක් ලබා තිබීම;

*හෝ*

(ii) ඉංග්‍රීසි (විශේෂ) ගුරු පුහුණු සහතිකය හෝ විද්‍යා පීඨ ඩිප්ලෝමා සහතිකය (ඉංග්‍රීසි);

*හෝ*

(iii) අ. පො. ස. (උ/පෙළ) විභාගය නව විෂය නිර්දේශය යටතේ විෂයයන් තුනම සමත්වීම සහ අ. පො. ස. (උ/පෙළ) විභාගයේදී සාමාන්‍ය ඉංග්‍රීසි සඳහා සාමාර්ථයක් ලබා තිබීම.

*හෝ*

(iv) අ. පො. ස. (උ/පෙළ) විභාගය සමත්ව තිබීම සහ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු

ලබන වාණිජ කර්මාන්ත සහ වැඩිදුර අධ්‍යාපනය සඳහා වන ඉංග්‍රීසි පිළිබඳ ජාතික සහතික පත්‍ර විභාගයෙන් සාමාර්ථය ලබා තිබීම හෝ සමාන සුදුසුකම් ලබා තිබීම.

(සැ. යු.—අර්ධ කාලීන අයදුම්කරුවන් අදාළ ක්ෂේත්‍රය සම්බන්ධ රැකියාවක නිරත විය යුතුය.)

08. **උසස් ජාතික ව්‍යාපාර මූල්‍ය ඩිප්ලෝමා- උ. ජා. ව. මූ. ඩි - (පූර්ණ කාලීන) - කාලය වසර 2 1/2 යි**

*අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් අතුරෙන් එකක් සපුරා තිබිය යුතුය :-*

(i) අ.පො.ස. (උ.පෙළ) විභාගය යටතේ ආර්ථික විද්‍යාව සහ ව්‍යාපාර අධ්‍යයනය සහ ගිණුම්කරණය යන විෂයයන් තුනෙන් සාමාර්ථය හෝ ඉහත විෂයයන් 2ක් සහ භූගෝල විද්‍යාව, ගෘහ ආර්ථික විද්‍යාව, දේශපාලන විද්‍යාව, තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය, කෘෂි විද්‍යාව හෝ සංයුක්ත ගණිතය යන විෂයයන්ගෙන් එකක් ඇතුළුව එක් වරකදී විෂයයන් තුනකින් සමත්ව තිබීම;

*හෝ*

(ii) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව මගින් පවත්වන ගණකාධිකරණ ජාතික සහතික පත්‍ර විභාගය සමත් වී තිබීම.

*සහ*

අ.පො.ස. (සා.පෙළ.) විභාගය සඳහා ඉංග්‍රීසි භාෂාව විෂයට හා ගණිතය විෂයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

09. **උසස් ජාතික ආහාර තාක්‍ෂණ ඩිප්ලෝමා - උ. ජා. ආ. තා. ඩි. (පූර්ණ කාලීන) - කාලය වසර 2 1/2**

*අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය :-*

(i) අ.පො.ස. (උ.පෙළ) විභාගය ජීව විද්‍යාව හෝ භෞතික විද්‍යාව විෂය ධාරාවන් යටතේ විෂයයන් තුනම එක් වරක දී සමත් ව තිබිය යුතුය;

*සහ*

අ. පො. ස. (සා. පෙළ.) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය විෂය සඳහා සාමාර්ථයක් ලබා තිබීම.

*"ආ" කොටස*

*උසස් තාක්ෂණ ආයතන/උසස් තාක්ෂණ ආයතන අංශ, ලිපිනයන්, දුරකථන අංක හා පවත්වන පාඨමාලා :*

| *සංකේත අංකය* | *ආයතන/ආයතන අංශය* | *ලිපිනයන්* | *දුරකථන අංක* | *පවත්වන පාඨමාලාවන්* |
|---|---|---|---|---|
| 01 | හාඩි උසස් තාක්‍ෂණ ආයතනය, අම්පාර | ඉඟිනියාගල පාර, අම්පාර | 063-2222056<br>063-2223035 | උ. ජා. ග. ඩි. (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා.) උ. ජා. ක. ඩි., උ. ජා. තො. තා. ඩි. (පූ. කා.), උ. ජා. තා. ඩි. (කෘෂි), උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.) |
| 02 | උසස් තාක්‍ෂණ, ආයතන අංශය, අනුරාධපුරය | අංක 388/35 හරිස්චන්ද්‍ර මාවත අනුරාධපුරය | 025-2234417 | උ. ජා. ග. ඩි. (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.), |
| 03 | උසස් තාක්‍ෂණ ආයතනය, බදුල්ල | ග්‍රීන්ලන්ඩ් ඩ්‍රයිව්, බදුල්ල | 055-2230218<br>055-2223818 | උ. ජා. ග. ඩි. (පූ. කා), උ. ජා. ග. ඩි. (අ. කා.), උ. ජා. ක. ඩි, උ. ජා. ව්‍යා. ප. ඩි., උ. ජා. තො. තා. ඩි. (පූ. කා.), උ. ජා. තො. තා. ඩි. (අ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.) උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.) උ. ජා. ස. ස. ක. ඩි. |
| 04 | උසස් තාක්‍ෂණ ආයතන අංශය, මඩකලපුව | මල්ටි පර්පස් ගොඩනැගිල්ල, කෝවිල් කුලම් නැගෙනහිර, අරයාම්පති | 065-2247519 | උ. ජා. ග. ඩි. (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා.), උ. ජා. ඉංග්‍රීසි. ඩි. (අ. කා.), උ. ජා. ඉංග්‍රීසි. ඩි. (පූ. කා.) |
| 05 | උසස් තාක්‍ෂණ ආයතනය, දෙහිවල | අංක 51 වෛද්‍ය පාර, දෙහිවල | 011-2714270<br>011-2738349 | උ. ජා. ග. ඩි (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා.) උ. ජා. ක. ඩි., උ. ජා. ව්‍යා. ප. ඩි. උ. ජා. තො. තා. ඩි. (පූ. කා), උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.), උ. ජා. ව්‍යා. මූ. ඩි. උ. ජා. ස. ස. ක. ඩි. |

| සංකේත අංකය | ආයතන/ආයතන අංශය | ලිපිනයන් | දුරකථන අංක | පවත්වන පාඨමාලාවන් |
|---|---|---|---|---|
| 06 | උසස් තාක්‍ෂණ ආයතනය, යාපනය | අංක 665/5 වෙරළ පාර, යාපනය | 021-2222595<br>021-2239803 | උ. ජා. ඉ. ඩි., උ. ජා. ග. ඩි. (පූ. කා), උ. ජා. ග. ඩි. (අ. කා.), උ. ජා. ක. ඩි. උ. ජා. ව්‍යා. ප. ඩි., උ. ජා. තො. තා. ඩි. (පූ. කා.), උ. ජා, තො. තා. ඩි. (අ. කා.) උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.), උ. ජා.ඉංග්‍රීසි ඩි (අ. කා.) |
| 07 | උසස් තාක්‍ෂණ ආයතනය, මහනුවර | අංක 16, කැප්පෙටිපොල පාර, මහනුවර | 081-2226644<br>081-2232097 | උ. ජා. ග. ඩි. (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා.), උ. ජා. ක. ඩි., උ.ජා. ව්‍යා. ප. ඩි, උ. ජා. තො. තා. ඩි. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.) උ. ජා. ඉංග්‍රීසි ඩි, (අ. කා.) උ. ජා, ස. ස. ක.ඩි |
| 08 | කෑගල්ල උසස් තාක්‍ෂණ ආයතනය, කෑගල්ල | බංඩාරනායක මාවත, කෑගල්ල | 035-2221297<br>035-2221713 | උ. ජා. ග. ඩි. (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා) උ. ජා. තො. තා. ඩි. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.) උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.) |
| 09 | උසස් තාක්‍ෂණ ආයතනය, කුරුණෑගල | අංක 22/1, විල්ගොඩ පාර, කුරුණෑගල | 037-2224911<br>037-2229583 | උ. ජා. ග. ඩි. (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා,), උ. ජා. ක. ඩි., උ. ජා. තො. තා. ඩි. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.), |
| 10 | ගාල්ල උසස් තාක්‍ෂණ ආයතනය, ගාල්ල | සිරිධම්ම මාවත, ලබුදූව, අක්මීමන | 091-2227880<br>091-2246179 | උ. ජා. ඉ. ඩි, උ. ජා. ග. ඩි. (පූ. කා), උ. ජා. ග. ඩි. (අ. කා.), උ. ජා. ක. ඩි., උ. ජා. ව්‍යා. ප. ඩි, උ. ජා. තො. තා. ඩි. (පූ. කා.), උ. ජා. තො. තා. ඩි (අ. කා), උ. ජා. තා. ඩි. (කෘෂි), උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා), උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.), උ. ජා. ප්‍ර. මි. ස. ඩි., උ. ජා. ගො. සේ. ඉ. ඩි. |
| 11 | උසස් තාක්‍ෂණ ආයතනය, කොළඹ | අංක 42, රොද්‍රිගු පෙදෙස, කොළඹ 15. | 011-2529479<br>011-2521282<br>011-2521152 | උ. ජා. ඉ. ඩි., උ. ජා. ප්‍ර. මි. ස. ඩි., උ. ජා. ගො. සේ. ඉ.ඩි. |
| 12 | උසස් තාක්‍ෂණ ආයතනය, ගම්පහ | නයිවල, එස්සැල්ල, වේයන්ගොඩ | 033-2287519<br>033-2292544 | උ. ජා. ග. ඩි. (පූ. කා.) උ. ජා. ග. ඩි. (අ. කා.) උ. ජා. තො. තා. ඩි. (පූ. කා.), උ. ජා. තො. තා. ඩි. (අ.කා.), උ. ජා. තා. ඩි. (කෘෂි) උ. ජා. ආ. තා. ඩි |
| 13 | උසස් තාක්‍ෂණ ආයතනය, රත්නපුරය | නව නගරය, රත්නපුරය | 045-2230780 | උ. ජා. ග. ඩි (අ. කා), උ. ජා. ග. ඩි. (පූ. කා.) උ. ජා. ඉංග්‍රීසි ඩී. (පූ. කා.) උ. ජා. තො. තා. ඩි. (පූ. කා.) |
| 14 | උසස් තාක්‍ෂණ ආයතන අංශය, සමන්තුරේ | මහ වීදිය, සමන්තුරේ | 067-2261304 | උ. ජා. ග. ඩි. (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.) |
| 15 | උසස් තාක්‍ෂණ ආයතනය තංගල්ල | යායවත්ත, නෙතොල්පිටිය, තංගල්ල | 0472241842<br>0472241843<br>0472241844 | උ. ජා. ග. ඩි. (අ. කා.), උ. ජා. ග. ඩි. (පූ. කා) උ. ජා. ඉංග්‍රීසි ඩී. (පූ. කා.) උ. ජා. තො. තා. ඩි. (පූ. කා.) |
| 16 | උසස් තාක්‍ෂණ ආයතනය, ත්‍රිකුණාමලය | කන්නියා පාර, වරෝධය නගර්, ත්‍රිකුණාමලය | 026-3262937 | උ. ජා. ග. ඩි. (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා.) උ. ජා. තො. තා. ඩි. (පූ. කා.) උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි. ඩි. (අ. කා.) |
| 17 | උසස් තාක්‍ෂණ ආයතනය, වවුනියාව | "ජනවතු පියස" අංක 320, ටී. බී. ජයා මාවත කොළඹ 10. | 011-2691307 | උ. ජා. ග. ඩි. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.), උ. ජා. තො. තා. ඩි. (පූ. කා.) |

සැළකිය යුතුයි ෑ

(1) උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා, උසස් ජාතික ප්‍රමාණ හා මිනුම් සමීක්‍ෂණ ඩිප්ලෝමා, උසස් ජාතික ගොඩනැගිලි සේවා ඉංජිනේරු ඩිප්ලෝමා (පූර්ණ කාලීන) පාඨමාලාවන් සඳහා අයදුම්කරුවන් සතියේ දිනයන්හි පාඨමාලාවන් සඳහා සහභාගි වීමට නිදහස් විය යුතු අතර, සති අන්තයේ දී ද අවශ්‍යතා අනුව පාඨමාලා කටයුතුවලට සහභාගි වීමට හැකි විය යුතු ය.

(2) උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා (පූර්ණකාලීන) පාඨමාලාවේ දේශන පළමු සහ දෙවන වසර සතියේ දිනවල දිවා කාලයේ ද, තෙවන, සිව්වන වසර සති අන්තයේ ද පවත්වනු ඇත.

(3) උසස් ජාතික කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාවේ (පූර්ණකාලීන) දේශන පළමු හා දෙවන වසර සතියේ දිනවල දිවා කාලයේ දී ද, තෙවන වසර සඳහා සති අන්තයේ දී පවත්වනු ඇත.

(4) අ.පො.ස. (උ.පෙ.) නව නිර්දේශය යටතේ අයදුම්කරන්නන් සාමාන්‍ය පොදු පරීක්ෂණය සමත්ව තිබීම අනිවාර්ය වේ.

(5) අදාළ පාඨමාලාවන්ට තෝරා ගැනීමේ දී අ.පො.ස. (උ.පෙ.) හෝ Z-Score සැළකිල්ලට ගනු ලැබේ.

(6) සුදුසුකම් ලද විභාගයේ දී පාඨමාලාවට අදාළ විෂයයන්ගෙන්/විෂයය ක්ෂේත්‍රයේ සාමාර්ථයක් ලත් අය කෙරෙහි වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

(7) පූර්ණකාලීන පාඨමාලාව සඳහා වයස අවු. 23ට අඩු අය කෙරෙහි වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

(8) අදාළ උසස් තාක්‍ෂණ ආයතනයක හෝ උසස් තාක්‍ෂණ ආයතන අංශයක පාඨමාලාවක් පැවැත්වීම සඳහා අවම වශයෙන් අයදුම්කරුවන් 50ක් සිටිය යුතු ම වේ.

(9) අදාළ උසස් තාක්‍ෂණ ආයතනයක හෝ ආයතන අංශයක පැවැත්වෙන පාඨමාලාවක් සඳහා නියමිත ශිෂ්‍ය සංඛ්‍යාව ඉක්මවා යන අයදුම්පත් ප්‍රමාණයක් වේ නම්, එම ආයතනය විසින් පවත්වන යෝග්‍යතා විභාගයක් මගින් නියමිත ශිෂ්‍ය සංඛ්‍යා බඳවා ගනු ලැබේ.

(10) කුමණ හේතුවක් නිසා හෝ තෝරා ගැනීමෙන් පසු පූර්ණ කාලීන සිසුන් අදාළ පාඨමාලාව හැදෑරීම සඳහා වෙනත් උසස් තාක්‍ෂණ ආයතනයකට හෝ ආයතනය අංශයකට මාරු කරනු නොලැබේ.

(11) ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනයේ අවුරුදු 03ක් හෝ ඊට වැඩි කාලයක පාඨමාලාවකට ලියාපදිංචි වන ශිෂ්‍යයෙකුට විශ්ව විද්‍යාල ප්‍රවේශයට අයදුම් කිරීමට හැකිවන පරිදි තම ලියාපදිංචිය, ලියාපදිංචි වීමට අදාළ ආයතනය විසින් දී ඇති අවසාන දින සිට දින 60ක කාලයක් ඇතුළත අවලංගු කිරීමට ඉඩ ලබාදිය හැකි ය.

සටහන :

ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනයට 2015 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්‍ෂ ජනරාල්වරයාගේ තීරණය අවසාන තීරණය වේ.

අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2014.12.31 වේ.

Web site : www.sliate.ac.lk

ඩබ්ලිව්. හිලරි ඊ. සිල්වා,
අධ්‍යක්‍ෂ ජනරාල්,
ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනය.

අංක 320, 'ජනවතු පියස',
ටී. බී. ජයා මාවත, කොළඹ 10.

*Office use only* – Course Number :.........................................

*Specimen Application Form*

**SRI LANKA INSTITUTE OF ADVANCED TECHNOLOGICAL EDUCATION**

***APPLICATION FORM FOR ADMISSION TO HIGHER NATIONAL DIPLOMA COURSES IN YEAR 2015***

| *Name of the Course* | *Order of Preference* |
|---|---|
| 1. ............................ | ........................................... |
| 2. ............................ | ........................................... |
| 3. ............................ | ........................................... |
| 4. ............................ | ........................................... |
| 5. ............................ | ........................................... |

1. Name with initials :————.

2. Name/Names denoted by Initials :————.

3. Address :————.

4. Date of Birth :
   Year :————., Month :————., Date :————.

   Age (as at 31.12.2014) :

   Years :————., Months :————., Days :————.

5. National Identity Card No. :————.

6. Sex : ————.

7. Administrative District :————. Contact Phone Number :————.

8. (i) Results of GCE (A/L) Examination (on or before 2013)

   Year :————, Index No. :————. Medium :————.

| *Subjects* | *Grade* |
|---|---|
| 1. ..................................... | ..................................... |
| 2. ..................................... | ..................................... |
| 3. ..................................... | ..................................... |
| 4. ..................................... | ..................................... |

Common General paper : Pass/Fail

Aggregate/Z-score of the above examination :————.

(ii) Result of GCE (O/L) Examination :————.

Year :————. Index No.:————. Medium :————.

| *Subjects* | *Grade* | | *Subjects* | *Grade* |
|---|---|---|---|---|
| 1. .................................... | .................................... | 6. | .................................... | .................................... |
| 2. .................................... | .................................... | 7. | .................................... | .................................... |
| 3. .................................... | .................................... | 8. | .................................... | .................................... |
| 4. .................................... | .................................... | 9. | .................................... | .................................... |
| 5. .................................... | .................................... | 10. | .................................... | .................................... |

9. Highest Qualification in English as a subject :————.

10. Only for part-time Courses
Details of Present Employment : Date of Appointment :————.

Post :————.
E. P. F. Number :————.
Place of Work and Address :————.

I do hereby declare that I am not following any other full-time course of study in any other state institution. I am aware that my registration will be cancelled at any time during the period of study if it is found that, I concurrently follow a full-time course at any other state institution. I do hereby certify that the information furnished here is true and accurate to the best of my knowledge.

————,
Signature of Applicant.

Date :————.

(The bank receipt for Rs. 500 payable to SLIATE should be annexed.)

12-188

---

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් පැවැත්වෙන කෘෂිකර්ම නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව - 2015/2016 සඳහා ඇතුලත් කරගැනීමේ තරග විභාගය

2015/2016 කෘෂිකර්ම නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ එක් අවුරුදු ඩිප්ලෝමාවට (NVQ Level - 5) ඇතුලත් කරගැනීමේ තරග විභාගයට අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විභාග අංශය මගින් 2015 ජනවාරි මාසය තුළ ප්‍රධාන නගර කිහිපයක පිහිටවනු ලබන විභාග මධ්‍යස්ථානයන්හි පවත්වනු ලැබේ.

02. කෘෂිකර්ම නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව (NVQ Level -5) කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් කෘෂිකර්ම විද්‍යාල වල සහ තෝරාගත් වෙනත් පුහුණු ආයතන තුළ පවත්වාගෙන යාමට නියමිතය.

2.1 කෘෂිකර්ම නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව ගැහැණු, පිරිමි දෙපක්ෂයටම විවෘත වන අතර, පවත්වනු ලබන තරග විභාගයේ ඉහළම ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් පුහුණු ආයතන වල ඇති ධාරිතාවයට සරිලන ප්‍රමාණයක් තෝරා ගනු ලබයි.

2.2 විභාගය සමත් අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කර බැලීමට පමණක් සම්මුඛ පරීක්ෂණයක් සිදු කරන අතර, එයට ලකුණු ලබාදීමක් සිදු නොකරයි.

2.3 මෙම පාඨමාලාව සිංහල හා දෙමළ භාෂා වලින් පවත්වනු ලබයි.

2.4 මෙම පාඨමාලාව පූර්ණ කාලීන නේවාසික පාඨමාලාවක් වේ. සියලු පුහුණුවන්නන් ආයතනයේ පුහුණු කාල පරිච්ඡේදය තුළ අනිවාර්යයෙන්ම නේවාසිකාගාර වල නැවතී පුහුණුව ලබාගත යුතුය.

2.5 පුහුණුආයතන තුළ වසරක පුහුණුවෙන් පසු, තුන් මසක් නම් කරන ලද ආයතනයක් තුළ ඨකියාස්ථ පුහුණුවක යෙදීම අනිවාර්ය වේ.

2.6 ඉහත පුහුණුව සාර්ථකව අවසන් වූ පසු තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිසම මගින් පුහුණුලාභීන් ඇගයීමට ලක් කොට NVQ Level -05 මට්ටමේ සහතිකයක් ලබාදේ.

2.7 මෙම සහතිකය කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ඇතුලු අනෙකුත් කෘෂිකර්මයට සම්බන්ධව රජයේ ආයතනවල තාක්‍ෂණ සහකාර මට්ටමේ ඨකියා සඳහා වන සුදුසුකමක් වේ.

03. *පාඨමාලාවට ඇතුලත්වීමේ සුදුසුකම්* :

3.1 සිංහල/දෙමළ, ගණිතය සහ විද්‍යාව යන විෂයයන් තුනට අනිවාර්යයෙන් සම්මාන සාමාර්ථ හෝ විශිෂ්ඨ සාමාර්ථද, සමාජ අධ්‍යයනය හෝ කෘෂිකර්මය හෝ ඉතිහාසය හෝ ජීවන නිපුනතා හා පුරවැසි අධ්‍යාපනය හෝ කෘෂි ආහාර තාක්‍ෂණය හෝ උද්‍යාන විද්‍යාව යන විෂයයන් 06න් එකකටවත් සම්මාන සාමාර්ථයක් ඇතිව (මේ අනුව සම්පූර්ණයෙන් සම්මාන සාමාර්ථ හතරක් (04) තිබිය යුතුය) දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06ක් සහිතව අ. පො. ස. (සා. පෙළ) සමත් වී තිබිය යුතුය. මෙහිදී එක් වරකදී විෂයන් 05ක් සමත්ව තිබිය යුතුය.

*සහ*

අ. පො. ස. (උ. පෙළ) විභාගයේ ජීව විද්‍යා විෂය ධාරාව හදාරා උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව, සත්ත්ව විද්‍යාව, කෘෂිකර්මය, ජීව විද්‍යාව යන විෂයයන්ගෙන් එක් විෂයක්වත් සමත්වී තිබිය යුතුය. (උසස් පෙළ සඳහා ගණිත විෂය ධාරාව හැදෑරූ සිසුන් රසායන විද්‍යාව හෝ භෞතික විද්‍යාව සමත්වී තිබීම මෙම පාඨමාලාව තෝරා ගැනීමේ සුදුසුකමක් ලෙස සලකනු නොලැබේ.)

3.2 අයදුම්පත් භාරගන්නා අවසාන දිනට ඉල්ලුම්කරුගේ වයස අවුරුදු 17ට නොඅඩු විය යුතු අතර අවුරුදු 25ට වඩා වැඩි නොවිය යුතුය. රාජ්‍ය සේවයේ නියුතු අයට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

3.3 කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාලව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිසම මගින් ලබාදෙන පහත NVQ Level 4 පාඨමාලාවන් හදාරා සහතික ඇති අයදුම්කරුවන්ටද මෙම පාඨමාලාවට අයදුම් කළ හැක.

* පැල තවාන් සංවර්ධන සහායක
* ක්ෂේත්‍ර සහායක (කෘෂිකර්ම)
* උද්‍යාන අලංකරණ ශිල්පී

හෝ කෘෂිකර්ම ක්ෂේත්‍රයට සම්බන්ධ කෘෂිකර්ම අධ්‍යක්‍ෂ ජනරාල්වරයා විසින් අනුමත කරන එම මට්ටමේ පාඨමාලා

3.3.1 ඉහත NVQ Level 4 පාඨමාලාවක් සාර්ථකව හදාරා සහතික හිමි අයදුම්කරුවන් සඳහා අධ්‍යාපන සුදුසුකම්

සිංහල/දෙමළ, ගණිතය සහ විද්‍යාව යන විෂයයන් තුනට අනිවාර්යෙන් සම්මාන සාමාර්ථ හෝ විශිෂ්ට සාමාර්ථද, සමාජ අධ්‍යයනය හෝ කෘෂිකර්මය හෝ ඉතිහාසය හෝ ජීවන නිපුනතා හා පුරවැසි අධ්‍යාපනය හෝ කෘෂි ආහාර තාක්‍ෂණය හෝ උද්‍යාන විද්‍යාව යන විෂයයන් 06න් එකකටවත් සම්මාන සාමාර්ථයක් ඇතිව (මේ අනුව සම්පූර්ණයෙන් සම්මාන සාමාර්ථ හතරක් (04) තිබිය යුතුය) දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06ක් සහිතව අ. පො. ස. (සා. පෙළ) සමත් වී තිබිය යුතුය. මෙහිදී එක් වරකදී විෂයන් 05ක් සමත්ව තිබිය යුතුය.

*සහ*

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිසම මගින් පිළිගත් ආයතනයක NVQ Level 4 මට්ටමේ කෘෂිකර්ම ක්‍ෂේත්‍රයට අදාල පාඨමාලාවක් හදාරා ලබාගත් සහතික පත්‍රයලත් අයකු වීම.

3.3.2 මෙම අයදුම්කරුවන් අයදුම්පත් කැඳවන අවසාන දිනට අවුරුදු 17ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 35ට වඩා නොවැඩි විය යුතුය.

3.3.3 මෙම අයදුම්කරුවන් සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් වෙනම තරග විභාගයක් පවත්වනු ලබන අතර එයින් ඉහළම ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් හට බඳවා ගැනීමට හැකි මුලු අයදුම්කරුවන් සංඛ්‍යාවෙන් 10% අවස්ථාවක් ලබාදීමට කටයුතු කරනු ලැබේ. මෙම අයදුම්කරුවන් සඳහා විභාගය පවත්වන දිනය කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් පසුව දැනුම් දෙනු ලැබේ.

04. *පාඨමාලාවට අයදුම්කිරීම* :

4.1 මෙම දැන්වීම අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය ප්‍රකාර අයදුම්කරුවන්ගේ අත් අකුරුවලින් හෝ යතුරු ලියනය කර හෝ පරිගණක ගත කරගෙන 8"x 12" ප්‍රමාණයේ (A 4 ප්‍රමාණයේ) කඩදාසියක දෙපැත්තම භාවිතා කරමින් තම අයදුම්පත සකස් කළ යුතුය. අයදුම්පත පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍ර වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද,

දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතු වේ. එහි අංක 01 සිට අංක 08 තෙක් මුල් පිටුවේ ද, 9 සිට 12 දක්වා දෙවන පිටුවේ ද, 13 සිට 15 දක්වා තුන්වන පිටුවේ ද, ඉතිරිය 4 වැනි පිටුවේ ද සඳහන් කළ යුතු වේ. අසම්පූර්ණව පුරවා ඇති හා ආදර්ශ ආකෘතිය අනුව සකස් නොකළ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත. තමන් සම්පූර්ණ කරනු ලබන අයදුම් පත්‍රය මෙම ගැසට් නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතියට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු/කාරිය විසින් වග බලාගත යුතු වේ. ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් තමන් ළඟ තබාගත යුතු වේ.

4.2 විභාග ගාස්තුව රු. 700කි. අපේක්ෂකයා විසින් මහජන බැංකුවේ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ "අංක 057100179027204" දරන ගිණුමට රු. 700 ක මුදලක් බැර කර ලබාගත් කුවිතාන්සිය අයදුම්පත්‍රයේ අලවා එවීමට කටයුතු කළ යුතුය.

4.3 සියලුම අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් පමණක් 2014 දෙසැම්බර් 26 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "අධ්‍යක්ෂ, ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය" යන ලිපිනයට එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේ දී ප්‍රමාද වන හෝ නැතිවන හෝ අයදුම්පත් ගැන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වගකීම් දරනු නොලැබේ.

4.4 අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "2015/2016 එක් අවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමා පාඨමාලාවට ඇතුළත් වීම" යන්න පැහැදිලිව සඳහන් කළ යුතුය.

05. *විභාග මධ්‍යස්ථාන :*

2015/2016 කෘෂිකර්ම නිෂ්පාදන තාක්‍ෂණය පිළිබඳව ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සිසුන් ඇතුලත් කරගැනීමේ තරග විභාගය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් සිංහල හා දෙමළ මාධ්‍යවලින් 2015 ජනවාරි මාසය තුළදී පහත සඳහන් නගරවල පිහිටවනු ලබන විභාග මධ්‍යස්ථානවල දී පවත්වනු ලැබේ :-

| *නගර අංකය* | *නගරය* |
|---|---|
| 1. | ගම්පහ |
| 2. | අම්පාර |
| 3. | දඹුල්ල |
| 4. | ගාල්ල |
| 5. | හම්බන්තොට |
| 6. | කුරුණෑගල |
| 7. | මහනුවර |
| 8. | වවුනියාව |

කිසියම් විභාග මධ්‍යස්ථානයක් සඳහා ප්‍රමාණවත් විභාග අපේක්ෂකයන් සංඛ්‍යාවක් අයදුම් කොට නොමැති විට ඔවුන්ගේ දෙවැනි කැමැත්ත මත අනුව හෝ අයැදුම් කොට ඇති මධ්‍යස්ථානයට සමීප වෙනත් විභාග මධ්‍යස්ථානයක් හෝ ඔවුන්ට නියම කෙරෙනු ඇත. විභාගය සඳහා ඉල්ලුම් කළ නගරය/නගර හෝ භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

06. *විභාග ක්‍රමය :*

6.1 *තරග විභාගය සඳහා වූ විෂයයන් හා කාල සටහන පහත සඳහන් වේ :*

| | *විෂයයන්* | *කාලය* | *කාල සටහන* |
|---|---|---|---|
| පළමු ප්‍රශ්න පත්‍රය - | 01. කෘෂිකර්මය (ලකුණු 100 යි)<br>(අ. පො. ස. (සා. පෙළ) කෘෂිකර්ම විෂයය නිර්දේශ මට්ටම හා කෘෂිකර්ම ක්ෂේත්‍රයේ පොදු විෂය කරුණු ආශ්‍රිතව සකස් කළ බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න අඩංගු වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය). | පැය 1 යි | 10.00 පැය - 11.00 පැය |
| දෙවන ප්‍රශ්න පත්‍රය - | 02. බුද්ධි පරීක්‍ෂණය (ලකුණු 100යි)<br>(රටා, සබඳතා, පුරෝකථන, ගැලපීම්, විශ්ලේෂණ කුසලතා පිළිබඳ හැකියා ආදිය පරීක්ෂාවට ලක් වේ. බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50කින් යුක්ත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු වේ). | පැය 1 යි | 11.30 පැය - 12.30 පැය |

6.2 මෙහි 3.1, 3.2, 3.3.1 සහ 3.3.2 ඡේදයන්හි සුදුසුකම් ඇති සියලුම අයදුම්කරුවන්ට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ප්‍රවේශ පත්‍ර එවනු ලැබේ. විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍ර විභාග ශාලාවේ ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් කෘෂිකර්ම

දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02ක් හෝ 03ක් හෝ ගතවූ පසුවත් ප්‍රවේශපත්‍ර නොලැබුණි නම්, ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද, සඳහන් කර පහත අ, ආ, සහ ඇ හි සඳහන් ලියවිලිවල සහතික කරන ලද ඡායා පිටපත් ද සමගින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත ඔබගේ ප්‍රවේශ පත්‍රය නොලැබීම පිළිබඳව දැන්වීම වඩා ඵලදායි වනු ඇත:-

(අ) අයදුම්පත්‍රයේ ඡායා පිටපතක්,
(ආ) මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක්,
(ඇ) අයදුම්පත්‍රය ලියාපදිංචි කළ කුවිතාන්සියේ ඡායා පිටපතක්.

6.3 කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් සිසුන් ලබාගත් ලකුණු ඔවුන්ගේ ලිපිනයන්ට එවනු ලැබේ. ඉහත විෂයයන් දෙකෙහි එකතුවෙහි වැඩිම ලකුණු ලබාගත් සිසුන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ඇත. මෙම ලිඛිත විභාගයට පෙනී සිටීමට ඉඩදීම මත හෝ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට කැඳවීම මත හෝ අදාළ අපේක්ෂකයාගේ සුදුසුකම් පිළිගැනීමක් නොවන බව සැළකිය යුතුය. විභාගයට පෙර හෝ එය පවත්වන අතර හෝ ඉන්පසුව හෝ යන කවර අවස්ථාවක දී වුවත් මෙම නිවේදනයේ කරුණු අනුව නුසුදුසු යැයි තීරණය වන අයදුම්කරුවන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

6.4 ලිඛිත විභාගයට හෝ සම්මුඛ පරීක්ෂණයට හෝ ඒ දෙකටම හෝ පෙනී සිටීම වෙනුවෙන් රජය විසින් අපේක්ෂකයින්ට කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

ආචාර්ය ආර් ආර්. ඒ. විජේකෝන්,
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.

***ආදර්ශ ඉල්ලුම් පත්‍රය***

*NVQ 5 මට්ටම කෘෂිකර්ම නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා එක් අවුරුදු පාඨමාලාවට ඇතුලත් කර ගැනීම සඳහා පැවැත්වෙන විවෘත තරග විභාගය - 2015*

Competitive Examination (open) for Admission to National Diploma in Agricultural Production Technology One Year Course Level 05- 2015

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි).

1.

| *විභාගයට පෙනී සිටින නගරය :* | *එහි අංකය :* |
|---|---|
| 1 වැනි තේරීම ............................ | ............ |
| 2 වැනි තේරීම ............................ | ............ |
| 3 වැනි තේරීම ............................ | ............ |

*(ගැසට් පත්‍රයේ මුල් ඡේදයට අනුව)*

2. *විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :*

සිංහල මාධ්‍යය - 2
දෙමළ මාධ්‍යය - 3

...............

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3. *පාඨමාලාව හැදෑරීමට කැමති මාධ්‍යය :*
සිංහල මාධ්‍යය - 2
දෙමළ මාධ්‍යය - 3

.................

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

4. ස්ත්‍රී/පුරුෂ භාවය :

| | |
|---|---|
| පුරුෂ | - 0 |
| ස්ත්‍රී | - 1 |

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

5. අ. පො. ස. (උසස් පෙළ) ජීව විද්‍යා විෂය ධාරාව හදාරා සමත් වී ඇති විෂයයන් ගණන : (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

| | |
|---|---|
| විෂයයන් තුනක් එකවර | - 3 |
| විෂයයන් දෙකක් හෝ එකක් එකවර | - 2 |

සමත් වූ විෂයයන් ගණනට අදාළ අංකය :
.................

(3.1 ඡේදයට අනුව)

6. (අ) (i) මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :—————.
(පැහැදිලි අකුරින්)

(ii) අගට යෙදූ මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරුවලින්) :—————.
*උදා.* : ANANDA, K. C. B.

(ආ) (i) මුලකුරුවලින් හැඳින්වෙන නම් :—————.

(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරුවලින්) :—————.

7. (i) සම්පූර්ණ ලිපිනය :—————.

(ii) විභාග ප්‍රවේශ පත්‍ර එවිය යුතු සම්පූර්ණ ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරුවලින්) :—————.

(iii) සම්බන්ධ කරගත හැකි දුරකථන අංකය :—————.

(i) ස්ථාවර : | | | | | | | | | |

(ii) ජංගම : | | | | | | | | | |

8. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | |

9. (අ) පදිංචි මැතිවරණ කොට්ඨාසය (සිංහලෙන්) :—————.

(ආ) මැතිවරණ කොට්ඨාසය (ඉංග්‍රීසියෙන්) :—————.

10. උපන් දිනය : අවුරුද්ද : | | | | | මාසය : | | | දිනය : | | |

11. 2014.12.31 වැනි දිනට වයස : අවුරුදු : | | | මාස : | | | දින : | | |

12. *අධ්‍යාපන සුදුසුකම් : (ගැසට් නිවේදනයේ සඳහන් විස්තර අනිවාර්යයෙන් කියවා මෙම කොටස පිරවිය යුතු වේ.) -NVQ 4 පාඨමාලාව හදාරා සුදුසුකම් ලැබූ අය සඳහා අදාළ නැත.*

(අ) ගැසට් නිවේදනයේ 3.1 ඡේදය අනුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සමත් විෂයයන් හය හෝ ඊට වැඩි ගණන :

| *විභාග අංකය* | *වර්ෂය සහ මාසය* | *සමත් විෂයයන්* | *විෂයය අංකය* | *සමත් ශ්‍රේණිය* |
|---|---|---|---|---|
| | | 1. | | |
| | | 2. | | |
| | | 3. | | |
| | | 4. | | |
| | | 5. | | |
| | | 6. | | |
| | | 7. | | |
| | | 8. | | |
| | | 9. | | |
| | | 10. | | |
| | | 11. | | |

(ආ) ගැසට් නිවේදනයේ 3.1 ඡේදය අනුව සම්මාන සාමාර්ථයන් ලබා ගැනීම අනිවාර්ය කර ඇති විෂයයන් හතර පිළිබඳ විස්තර :

| විභාග අංකය | වර්ෂය සහ මාසය | සමත් විෂයයන් | විෂයය අංකය | සමත් ශ්‍රේණිය |
|---|---|---|---|---|
| | | 1. සිංහල | | |
| | | 2. ගණිතය | | |
| | | 3. විද්‍යාව | | |
| | | 4. කෘෂිකර්මය | | |
| | | 5. සමාජ අධ්‍යයනය | | |
| | | 6. ඉතිහාසය | | |
| | | 7. ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය | | |
| | | 8. කෘෂි ආහාර තාක්‍ෂණය<br>9. උද්‍යාන විද්‍යාව | | |

අ. පො. ස. (උ. පෙ.) විභාගය සඳහා ජීව විද්‍යා විෂය ධාරාවන් හදාරා ඇත් ද? ඔව්/නැත (අදාළ නොවන වචනය කපා හරින්න.)

(ඇ) අ. පො. ස. (උ. පෙ.) විභාගයෙන් සමත් විෂයයන් :

| විභාග අංකය | වර්ෂය සහ මාසය | සමත් විෂයයන් | විෂයය අංකය | සමත් ශ්‍රේණිය |
|---|---|---|---|---|
| | | 1. ජීව විද්‍යාව | | |
| | | 2. කෘෂිකර්මය | | |
| | | 3. භෞතික විද්‍යාව | | |
| | | 4. රසායන විද්‍යාව | | |
| | | 5. සත්ත්ව විද්‍යාව | | |
| | | 6. උද්භිද විද්‍යාව | | |

(ඈ) ඉහත සඳහන් සුදුසුකම් සනාථ කිරීම සඳහා අධ්‍යාපන සහතිකවල ඡායා පිටපත් ඉල්ලුම් පත්‍රයට අමුණා එවන්න.
(මුල් පිටපත් එවිය යුතු නොවේ.)

අධ්‍යාපන සහතිකවල ඡායා පිටපත් අමුණා තිබේ ද? :————.

NVQ මට්ටම් 4 පාඨමාලාව හදාරා සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සඳහා

(i) අ. පො. ස. (සා. පෙළ) විභාග ප්‍රතිඵල :

| විභාග අංකය | වර්ෂය සහ මාසය | සමත් විෂයයන් | විෂයය අංකය | සමත් ශ්‍රේණිය |
|---|---|---|---|---|
| | | 1. | | |
| | | 2. | | |
| | | 3. | | |
| | | 4. | | |
| | | 5. | | |
| | | 6. | | |
| | | 7. | | |
| | | 8. | | |
| | | 9. | | |
| | | 10. | | |
| | | 11. | | |

(ii) හදාරා ඇති NVQ මට්ටම් 4 පාඨමාලාව පිළිබඳ විස්තර ඃ

(අ) පාඨමාලාවේ නම :————.
(ආ) පාඨමාලා කාලසීමාව :————.
(ඇ) පාඨමාලාව හැදෑරූ ආයතනය :————.
(ඈ) NVQ සුදුසුකම් ලැබූ වසර (සහතිකවල පිටපතක් මේ සඳහා ඉදිරිපත් කල යුතු ය.) :————.

(iii) අ. පො. ස. (උ. පෙළ.) විභාග ප්‍රතිඵල (තිබේනම්) ඃ

| විභාග අංකය | වර්ෂය සහ මාසය | සමත් විෂයයන් | විෂයය අංකය | සමත් ශ්‍රේණිය |
|---|---|---|---|---|
| | | 1. ජීව විද්‍යාව | | |
| | | 2. කෘෂිකර්මය | | |
| | | 3. භෞතික විද්‍යාව | | |
| | | 4. රසායන විද්‍යාව | | |
| | | 5. සත්ත්ව විද්‍යාව | | |
| | | 6. උද්භිද විද්‍යාව | | |

14. (i) දෙමව්පිය හෝ භාරකරුගේ නම සහ ලිපිනය :————.
(සිංහලෙන්)
(ii) දෙමව්පිය හෝ භාරකරුගේ නම සහ ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරුවලින්)

15. විභාග ගාස්තු පිළිබඳ විස්තර :
15.1 මහජන බැංකුවේ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 057100179027204 දරන ගිණුමට රු. 700 ක් බැර කර ලබාගත් කුවිතාන්සියේ අංකය :————.
15.2 මුදල් ගෙවන ලද මහජන බැංකු ශාඛාවේ නම :————.

මුදල් ඇණවුමේ උඩ කොටසේ තීරුවක පමණක් මැලියම් ගා මෙහි අලවන්න.
ලදුපතේ ඡායා පිටපතක් අනිවාර්යෙන්ම ඔබ ළඟ තබාගන්න.

*අයදුම්කරුගේ ප්‍රකාශය :*

මා විසින් මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති විස්තර සත්‍ය බවත්, නිවැරදි බවටත් මෙයින් සහතික කරමි. අ. පො. ස. (සා. පෙළ.) සමත් බවත්, සිංහල, විද්‍යාව, ගණිතය යන විෂයයන්ට සම්මාන සාමාර්ථයන් ඇති බවත්, සමාජ අධ්‍යයනය හෝ කෘෂිකර්මය හෝ ඉතිහාසය හෝ ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය හෝ කෘෂි ආහාර තාක්‍ෂණය හෝ උද්‍යාන විද්‍යාව යන විෂයන් හයෙන් එකකට සම්මාන සාමාර්ථයක් ඇති බවත් හා උසස් පෙළ ජීව විද්‍යා විෂය ධාරාවන් හදාරා ගැසට් නිවේදනයේ නම් කර ඇති සියලුම සුදුසුකම් සපුරා ඇති බවටත් සහතික වෙමි. මෙහි සඳහන් කරුණු අසත්‍ය බව හෝ වැරදි බව හෝ හෙළි වුවහොත්, මා තරග විභාගයට පෙනී සිටීමට හා කෘෂිකර්ම විද්‍යාලයට තෝරා ගැනීමට නුසුදුස්සෙකු වන බව මම දනිමි. මෙම විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති පිළිපැදීමට මම එකඟ වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

**අධ්‍යාපන සුදුසුකම් හා අත්සන සහතික කිරීම**

(දෙපාර්තමේන්තුවක හෝ පාසලක ප්‍රධානියෙක්, සාමදාන විනිශ්චයකාරවරයෙක්, නීතිඥයෙක් හෝ රුපියල් 2,30,060 ක් හෝ ඊට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියෙකු විසින් මෙම අයදුම්පත්‍රය සහතික කළ යුතුයි.)

ඉහතින් අත්සන් කර ඇති ................................ මයා/මිය/මෙනෙවිය මා හොඳින් දන්නා හඳුනන බවත්, ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් යෙදූ බවත් මෙයින් සහතික කරමි. තව ද, **ගැසට් නිවේදනයේ සඳහන් අ. පො. ස. (සා. පෙළ) හා අ. පො. ස. (උසස් පෙළ) සුදුසුකම් ඇති බවට ගැසට් නිවේදනය හා අධ්‍යාපන සහතිකවල මුල් පිටපත් පරීක්ෂා කර බලා වගකීමකින් යුතුව සහතික කරමි.** තව ද නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත්, එම ලදුපත මෙම ඉල්ලුම් පතෙහි අලවා ඇති බවත් සහතික කරමි.

————,
අත්සන
සුදුසුකම් සහතික කරන අයගේ
නිල මුද්‍රාව.

දිනය :————.
නම :————.
නිල නාමය :————.
ලිපිනය :————.

12-171

## යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

### ජාතික වෘත්තීය පුහුණු ආයතනය-නාරාහේන්පිට

*2015 වර්ෂය සඳහා ආධුනිකයින් බඳවා ගැනීම*

පූර්ණ කාලීන පාඨමාලා :

| *Course* | *NVQ Level* | *Duration (Months)* | *Qualifications* | *Course Fee (Rs.)* |
|---|---|---|---|---|
| Computer Hardware Technician A+ (CISCO IT Essential) | IV | 6 | D | 13,500 |
| CCNA Academy Program | Non | 6 | D | 41,500 |
| Computer Graphic Designer | IV | 6 | A | 14,000 |
| Adobe Certified Associate | Non | 6 | D | 16,500 |
| NVQ - IV in ICT (ICT Technician) | IV | 6 | D | 9,000 |
| NVQ - V in ICT with free CISCO IT Essential A + ** | V | 12 | M | 42,000 |
| Computer Graphic Designer (ශ්‍රවණාබාධිත) | IV | 6 | - | Free |
| National Certificate - Draftperson | IV | 12 | N | 22,000 |
| National Diploma in Quantity Surveying | V | 12 | O | 62,000 |
| Baker | IV | 6 | B | 31,500 |
| Cook | IV | 6 | I | 31,500 |
| Waiter/Steward | III | 6 | I | 6,000 |
| Automobile Mechanic | IV | 18 | A | 8,000 |
| Automobile A/C Mechanic | IV | 6 | A | 4,500 |
| Beautician | IV | 6 | B | 22,000 |
| Hairdresser | IV | 6 | B | 32,000 |
| Diploma in Industrial Management | Non | 6 | E | 25,000 |
| Electrician | IV | 12 | A | 7,000 |
| Offset Lithographic Operator | IV | 6 | I | 7,500 |
| Machinist (CNC Milling) | IV | 6 | C | 7,500 |
| Machinist | IV | 12 | A | 5,500 |
| Driver (Heavy Vehicle) | Non | 3 | F | 10,500 |
| Driver (Light Vehicle) | Non | 3 | G | 12,000 |

අර්ධ කාලීන පාඨමාලා :

| *Course* | *Duration (Hours)* | *Qualifications* | *Course Fee (Rs.)* |
|---|---|---|---|
| Computer Hardware Technician A+ (CISCO IT Essential) | 120 | A | 12,000 |
| CCNA Academy Program | 300 | D | 40,000 |
| PC Based Application Assistant (MS Office) | 100 | I | 9,500 |
| Computer Graphic Designer (NVQ IV) | 392 | H | 22,500 |
| ICT Technician (NVQ IV) | 350 | A | 20,000 |
| IC3 +International Certificate* | 120 | K | 10,000 |
| CCN Security | 150 | J | 20,000 |
| Auto Cad (2D)* | 80 | L | 7,500 |
| Auto Cad (3D)* | 80 | L | 8,000 |
| Baker | 100 | B | 14,000 |
| Cook | 100 | B | 14,000 |
| Auto Mobile Technician (Engine/Petrol/Diesel) | 160 | B | 10,500 |
| Draughtsmanship (Building Drawing) | 150 | D | 13,500 |
| CNC Programming | 125 | A | 9,000 |
| Electrical Wiring Industrial | 120 | A | 14,500 |
| Motor Control System | 100 | A | 13,000 |
| Automobile A/C Mechanic* | 125 | B | 13,000 |
| English Language | 100 | B | 10,500 |

පූර්ණ කාලීන පාඨමාලා සඳහා 2014.12.31 වැනි දිනට වයස අවු. 17ත් 35ත් අතර ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම අයදුම් කළ හැක. අර්ධ කාලීන පාඨමාලා සඳහා උපරිම වයස් සීමාවන් නොසැලකෙන අතර එම පාඨමාලා සෙනසුරාදා/ඉරිදා දිනයන්හි හා සන්ධ්‍යා කාලීනවද පැවැත්වේ.

අංක 15 16 පාඨමාලා එකවර හදාරන අයට පාඨමාලා ගාස්තුවෙන් රු. 1,200ක් අඩු කෙරේ.

ප්‍රතිලාභ :

* දේශීය - විදේශීය රැකියා අවස්ථා.
* කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආරම්භ කිරීමට අඩු පොළී ණය පහසුකම්.
* ජාතික හා ජාත්‍යන්තර පිළිගත් NVQ සහතිකයක්.
* විෂය දැනුමට අමතරව ඉංග්‍රීසි දැනුම.
* දීමනා සමඟ මාස 06ක වැඩිදුර පුහුණුව.

සුදුසුකම් :

A. අ.පො.ස.(සා.පෙළ) විෂයන් 06කින් සමත් වීම.

B. 9 වසර සමත් වීම.

C. ජාතික වෘත්තීය සුදුසුකම් යන්ත්‍ර ශිල්පී Q2 L3 සහතික ලබා තිබීම.

D. අ.පො.ස.(සා.පෙළ) ඉංග්‍රීසි සම්මාන සහිතව විෂයන් 06 කින් සමත් වීම.

E. පිළිගත් කාර්මික ආයතනයකින් මූලික පාඨමාලාවක් හදාරා ක්ෂේත්‍රයේ රැකියාවක නියුතු අය හෝ පිළිගත් ආයතනයක කාර්මික ක්ෂේත්‍රයේ වැඩ මූලික/ වැඩ මූලික සහායක/ වැඩ අධීක්ෂක රැකියාවක අවුරුදු 02 ක පළපුරුද්දක් තිබීම.

F. 9 වසර සමත්වීම හා අවුරුදු 21ට වැඩිවීම හා සැහැල්ලු වාහන රියදුරු බලපත්‍රය ලබා වසර 3ක් ගතවී තිබීම.

G. 9 වසර සමත්වීම සහ අවුරුදු 18ට වැඩිවීම.

H. අ.පො.ස.(සා.පෙළ) ගණිතය, විද්‍යාව ඇතුළුව විෂයන් 06කින් සමත් වීම සහ මූලික පරිගණක පාඨමාලාවක් හදාරා තිබීම.

I. අ. පො.ස. (සා. පෙළ) පෙනී සිටීම

J. CCNA පාඨමාලාවක් හදාරා තිබීම.

K. අ.පො.ස. (සා. පෙළ) ඉංග්‍රීසි සහිතව විෂයන් 06 කින් සමත් වී තිබීම.

L. මූලික සැලසුම් ශිල්පී පාඨමාලාවක් හදාරා තිබීම හෝ අදාළ ක්ෂේත්‍රයේ නියැලී සිටීම.

M. අ. පො. ස. (සා. පෙළ) ඉංග්‍රීසි, ගණිතය සම්මාන සහිතව විෂයන් 06කින් සමත්වීම සහ සහතික පත්‍ර පාඨමාලාව සමත්වීම.

N. අ. පො. ස. (උ/පෙළ) විෂයන් 3කින් සමත්වී තිබීම

O. අ.පො.ස.(උ. පෙළ) ගණිතය ඇතුළුව විෂයන් 02කින් සමත්වීම.

P. ඡායාරූප ශිල්පය පිළිබඳ පළපුරුද්ද ලබා තිබීම.

තමන් විසින් සකස් කරන ලද අයදුම්පත් 2014.12.25 වැනි දිනට පෙර පහත ලිපිනයට එවන්න.

සහකාර අධ්‍යක්ෂ,
ජාතික වෘත්තීය පුහුණු ආයතනය,
අංක 354, ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට.

දුරකථන අංක : 011-2592233, 011-7277111 (IT Center)
ඊ-මේල් : nvtinarahenpita@vtasl.gov.lk
ෆැක්ස් : 0112-592233.

12-175

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2-II ශ්‍රේණියේ පුරප්පාඩු සඳහා 3 පන්තියේ නිලධාරීන් උසස් කිරීම

අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති අධ්‍යාපන විද්‍යාපීඨ, ගුරු විද්‍යාල සහ ගුරු මධ්‍යස්ථානයන්හි ගුරු අධ්‍යාපනඥ සේවයේ 2-II ශ්‍රේණියේ පුරප්පාඩු පිරවීම සඳහා අධ්‍යාපන ලේකම් විසින් අයදුම්පත් භාරගනු ලැබේ.

2.0 මෙම නිවේදනයේ අග දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2014.12.29 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2-II ශ්‍රේණියේ පුරප්පාඩු සඳහා 3 පන්තියේ නිලධාරීන් උසස් කිරීම" යනුවෙන් සඳහන් කළ යුතුය. ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 3 පන්තියේ සේවයේ නියුක්ත පහත සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන්ගේ අයදුම්පත් ස්වකීය ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*3.0 සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

3.1 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 12.1 හා 12.6 සිට 12.12 දක්වා වගන්ති අදාළ වේ.

3.2 නේවාසික පහසුකම් සළසා ඇති විට අධ්‍යාපන විද්‍යාපීඨ සීමාව තුළ පදිංචි විය යුතුය.

3.3 තනතුරු සඳහා තෝරාගනු ලබන අපේක්ෂක අපේක්ෂිකාවන් සේවයේ අවශ්‍යතා අනුව කුමන අධ්‍යාපන විද්‍යාපීඨයක, ගුරු විද්‍යාලයක හෝ ගුරු මධ්‍යස්ථානයක වුව ද සේවය කිරීමට බැඳී සිටී. මෙම *ගැසට් පත්‍රයේ* I කොටස දක්වා ඇති රාජ්‍ය සේවා තනතුරු සඳහා පත්කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

*4.0 අයදුම් කිරීමට සුදුසුකම් :*

4.1 ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවා ව්‍යවස්ථාවේ 17 වැනි වගන්තිය අනුව උපාධිය ලබා ඇත්තේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් නොවේ නම් උසස් කිරීම සඳහා සුදුසුකම් ලැබීම පිණිස අ. පො. ස. (සා. පෙළ) හෝ සමාන විභාගයක දී ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍ය සඳහා සම්මාන සාමාර්ථයක් හෝ එයට උසස් සහතිකයක් ලබා තිබීම අවශ්‍යතාවක් වනු ඇත. මෙම සුදුසුකම් නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4.2 සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි කාර්යක්ෂමතා කඩඉම සමත්වී තිබීම.

*5.0 අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :*

*5.1 ගුරු අධ්‍යාපනඥ සේවයේ 2-II ශ්‍රේණිය :*

5.1.1 ගුරු අධ්‍යාපනඥ සේවයේ 3 පන්තිය යටතේ උපලේඛනගත තනතුරක වසර 07කට නොඅඩු සතුටුදායක සේවයක් සම්පූර්ණ කර සේවයේ ස්ථිර කර තිබීම ; සහ

5.1.2 පිළිගත් විශ්ව විද්‍යාලයකින් අධ්‍යාපනය පිළිබඳ පළමු පංතියේ හෝ 2 වැනි පංතියේ (ඉහළ) උපාධියක් ලබා තිබීම හෝ අධ්‍යාපනය පිළිබඳ (ඉහළ) උපාධියක් ලබා තිබීම ; *හෝ*

5.1.3 පිළිගත් විශ්ව විද්‍යාලයකින් අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ උපාධියක් ලබා තිබීම සහ විශිෂ්ඨ හෝ සම්මාන හෝ සාමාර්ථයක් සහිතව පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාවක් හෝ අදාළ විෂය ක්ෂේත්‍රයෙන් පශ්චාත් උපාධියක් ලබා තිබීම;

*හෝ*

5.1.4. පිළිගත් විශ්වවිද්‍යාලයකින් පළමු හෝ දෙවන පංතියේ (ඉහළ) සාමාර්ථයක් සහිතව උපාධියක් හා පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාවක් හෝ අදාළ විෂය ක්ෂේත්‍රයෙන් හෝ අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

*6.0 වැටුප් පරිමාණය :*

6.1 වැටුප් පරිමාණය SL 1-2006

*7.0 තෝරා ගැනීමේ ක්‍රමය :*

7.1 රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් එම කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ ලකුණු පරිපාටියකට අනුව පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත තෝරාගනු ලැබේ.

7.2 වාර්ෂිකව ඇතිවූ පුරප්පාඩු ගණනය කර අනුපිළිවෙලින් සම්පූර්ණ කරනු ලැබේ.

7.3 ***සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ පහත සඳහන් ලිපිලේඛනවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.*** :

7.3.1 උප්පැන්න සහතිකය (උපකෘත පාසල්වලට ඇතුළත් කිරීමේ නීති යටතේ නිකුත් කර ඇති උප්පැන්න සහතික හෝ බෞතීස්ම සහතිකය හෝ පිළිගනු නොලැබේ.)

7.3.2 උපාධි සහතික සහ අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ අනෙකුත් සහතික

7.3.3 වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික

7.3.4 සිංහල, ඉංග්‍රීසි හා දෙමළ භාෂා දැනුම පිළිබඳව ලබා ඇති අ. පො. ස. (සා/පෙළ) හා අනෙකුත් සහතික

7.4 පුරප්පාඩු සියල්ලම හෝ කිසියම් සංඛ්‍යාවක් පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

7.5 උසස්වීමේ දිනට පූර්වාසන්න වසර 05 තුළ දඬුවමකට භාජනය නොවීමෙන් හා වැටුප් වර්ධක උපයා ගැනීමෙන් සතුටුදායක සේවයක් සම්පූර්ණ කර තිබිය යුතුයි.

7.6 සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී අවශ්‍ය ලිපිලේඛන ඉදිරිපත් කිරීමට අපොහොසත්වන අයගේ අයදුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

අනුර දිසානායක,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2014 නොවැම්බර් මස 20 වැනි දින.

***ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2-II පන්තියේ පුරප්පාඩු සඳහා 3 පන්තියේ නිලධාරීන් උසස් කිරීම***
***ආදර්ශ අයදුම්පත්‍රය***

(A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපිටම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත්‍රය සකස් කර ගත යුතුය.)

01. (i) මුලකුරු සමග නම (සිංහලෙන්) :————.
(හිමි/මයා/මිය/මෙය)
(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම (සිංහලෙන්) :————.
(iii) මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(Rev/Mr./Mrs/Miss)
(iv) මුලකුරුවලින් හැඳින්වෙන නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

02. (i) රාජකාරි ලිපිනය (සිංහලෙන්) :————.
(ii) රාජකාරි ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(iii) පෞද්ගලික ලිපිනය (සිංහලෙන්) :————.
(iv) පෞද්ගලික ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(v) පෞද්ගලික දුරකථන අංකය :————.

03. (i) උපන් දිනය :————.
(ii) 2013.07.01 දිනට වයස : අවුරුදු [ ] මාස [ ] දින [ ]

04. ජාතික හැඳුනුම්පත් අංකය [ | | | | | | | | | ]

05. (i) මුල් පත්වීමේ දිනය හා තනතුර :————.
(ii) වර්තමාන තනතුර හා එයට පත්වූ දිනය :————.
(iii) වර්තමාන සේවා ස්ථානය :————.
(iv) විශ්‍රාම ලබා ඇත්නම් එම දිනය :————.
(v) ගුරු අධ්‍යාපනඥ සේවයේ 3 පන්තියට අදාළ පළමු කාර්යක්ෂමතා කඩඉම සමත් දිනය :————.

06. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ විස්තර :
(i) පළමු උපාධිය :

| *උපාධියේ නම හා නිකුත් කළ ආයතනය* | *වර්ෂය* | *පන්තිය* | *විශිෂ්ට/සම්මාන/ සාමාන්‍ය ද යන වග* |
|---|---|---|---|
| | | | |

(ii) පශ්චාත් උපාධිය :

| *සහතිකයේ නම සහ නිකුත් කළ ආයතනය* | *වර්ෂය* | *පන්තිය* | *විශිෂ්ට/සම්මාන /සාමාන්‍ය ද යන වග* |
|---|---|---|---|
| | | | |

(iii) පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව :

| *සහතිකයේ නම සහ නිකුත් කළ ආයතනය* | *පාඨමාලාවට ගත වූ කාලය* | *විශිෂ්ට ද සම්මාන ද යන වග* | *විෂයයන් පිළිබඳ විස්තරය* |
|---|---|---|---|
| | | | |

(iv) වෙනත් වෘත්තීය සුදුසුකම් (ඩිප්ලෝමා සහතික හා පුහුණු ගුරු සහතික පිළිබඳ විස්තර) :

| *සහතිකයේ නම සහ නිකුත් කළ ආයතනය* | *පාඨමාලාවට ගතවූ කාලය* | *විෂයයන් පිළිබඳ විස්තර* |
|---|---|---|
| | | |

(v) ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණතාව :

| *අ. පො. ස. සා/පෙළ* | *ප්‍රතිඵල වලංගු දිනය* | *සාමාන්‍යය/සම්මාන/ අධි සම්මාන* |
|---|---|---|
| | | |

(vi)

| *ඉංග්‍රීසි විෂයට අදාළව ලබා ඇති වෙනත් ප්‍රවීණතා* | *නිකුත් කළ ආයතනය හා වලංගු දිනය* | *ශ්‍රේණිය* |
|---|---|---|
| | | |

(vii) සේවා පිළිබඳ විස්තර (මුල් පත්වීමේ සිට)

| *ආයතනය* | *තනතුර* | *විෂයය* | *සිට* | *දක්වා* |
|---|---|---|---|---|
| | | | | |

07. දැනට ඔබට විරුද්ධව දෙපාර්තමේන්තුමය විනයානුකූල පරීක්ෂණයක් පවත්වන්නේ ද? නැතහොත් අධිකරණය ඉදිරියේ නඩුවක් විභාග වෙමින් පවතී ද ? (එසේ නම් විස්තර සඳහන් කරන්න.)

08. මෙම ඉල්ලුම්පතෙහි මා විසින් සඳහන් කර ඇති සියලුම තොරතුරු මාගේ දැනීමේ හැටියට සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙහි දී ඇති තොරතුරු කිසිවක් අසත්‍ය හෝ සාවද්‍ය බව අනාවරණය වුවහොත් ඒ මත මා මෙම තනතුර ලැබීමට නුසුදුස්සකු බවට තීරණය

කරන බවත්. පත්වීම ලැබීමෙන් පසු මෙහි සඳහන් තොරතුරු කිසිවක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව අනාවරණය වුවහොත් මා කිසිම වන්දියක් නොලබා තනතුරින් පහකිරීමට යටත්වන බව ද දනිමි.

________,
අයදුම්කරුගේ අත්සන.

දිනය :________.

**ආයතන ප්‍රධානියාගේ සහතිකය**

................................... ගේ ඉල්ලුම්පත ඉදිරිපත් කරමි. ඔහු/ඇය මෙම ආයතනයේ .................. වශයෙන් සේවය කරන බවට/සේවය කර ............ දින විශ්‍රාම ලබා ඇති බවට සහතික කරමි.

________,
ආයතන ප්‍රධානියා හෝ
එම ප්‍රධානියා වෙනුවට බලය ලබා
ඇති නිලධාරියාගේ අත්සන.

දිනය :________.

ආයතනය :________.

***ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 3 පන්තියේ නිලධාරීන් 2-II ශ්‍රේණියට උසස් කිරීමේ ලකුණු පරිපාටිය***

ලකුණු ලබාදීම සඳහා අදාළ සුදුසුකම් පුරප්පාඩුව ඇති වූ දිනට පෙර සපුරා තිබිය යුතුය.

1.0 *සේවා පළපුරුද්ද* *උපරිම ලකුණු 50*

ශ්‍රී. ලං. ගු. අ. සේ. 3 පන්තියේ වසර 07ට වැඩි අමතර සක්‍රීය සේවා කාලය සඳහා එක් වසරකට ලකුණු 10 බැගින් උපරිම වසර 05ක් සඳහා ලබාදෙනු ලැබේ.

2.0 *අතිරේක අධ්‍යාපන සුදුසුකම්* උපරිම ලකුණු 15

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2-II ට ඉල්ලුම් කිරීමට අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් වලට අමතරව ඇති සුදුසුකම් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.

| | | |
|---|---|---|
| 2.1 | උපාධිය | 05 |
| 2.2 | පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 10 |
| 2.3. | පශ්චාත් උපාධිය | 15 |

03. *ශාස්ත්‍රීය කාර්ය සාධනය* උපරිම ලකුණු 10

උපාධි, පශ්චාත් උපාධි ඩිප්ලෝමාව හෝ පශ්චාත් උපාධියට ඉදිරිපත් කරන ලද ලේඛන සඳහා ලකුණු ලබා දෙනු නොලැබෙන අතර එක් ප්‍රකාශනයක් සහ එක් පර්යේෂණයක් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.

| | | |
|---|---|---|
| 3.1. | පර්යේෂණ | |
| 3.1.1. | විධිමත්ව සැකසූ පර්යේෂණ වාර්තාව (අවසන් වාර්තාව) | 02 |
| 3.1.2 | රැකියා ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණයක් වීම | 01 |
| 3.1.3 | ප්‍රසිද්ධ පර්යේෂණ සාකච්ඡා මණ්ඩපයකට ඉදිරිපත් කර තිබීම | 02 |
| 3.2. | ප්‍රකාශන | |
| 3.2.1 | විෂයානුබද්ධ ප්‍රකාශන (පුවත්පත් වාර සඟරා ආදියේ ප්‍රසිද්ධියට පත් කළ) | 03 |
| 3.3.2. | විෂයානුබද්ධ පොත් පළ කිරීම | 02 |

04. *තොරතුරු තාක්‍ෂණ හැකියාව* උපරිම ලකුණු 10
(පිළිගත් ආයතනයකින් ලබා ගත් සහතික සඳහා පමණක් ලකුණු හිමිවේ.)

| | | |
|---|---|---|
| 4.1 | මාස 06ක් හෝ ඊට වැඩි තොරතුරු තාක්‍ෂණ ඩිප්ලෝමා පාඨමාලාවන් සඳහා | 05 |
| 4.2 | වසර 01 හෝ ඊට වැඩි තොරතුරු තාක්‍ෂණ ඩිප්ලෝමාවක් සඳහා | 10 |

05. *ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවාව තුළ ලබාගත් සේවා ඇගයීම්* උපරිම ලකුණු 05

| | | |
|---|---|---|
| 5.1 | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව නියමිත ආකෘතියෙන් විධිමත් සේවා ඇගයීම් හා ප්‍රශංසා ලිපි | 05 |

06. *භාෂා දැනුම* උපරිම ලකුණ 10

(රජයේ පිළිගත් ආයතනයකින් ලබා ගත් සහතික සඳහා පමණක් ලකුණු හිමිවේ.)

*ඉංග්‍රීසි භාෂාව*

| | | |
|---|---|---|
| 6.1 | මාස 06ක් හෝ ඊට වැඩි කාලයක ඉංග්‍රීසි භාෂා ඩිප්ලෝමාවක් සඳහා | 05 |
| 6.2 | වසර 01 හෝ වසර 01ට වැඩි කාලයක ඉංග්‍රීසි භාෂා ඩිප්ලෝමාවක් සඳහා | 10 |

මුළු ලකුණු 100

12-312

## ලසාලියානු වෘත්තීය අධ්‍යාපන ආයතනය

නවක සිසුන් බඳවා ගැනීම - 2015 වර්ෂය

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ මෙන්ම, පුණ්‍ය ආයතනයක් ද වශයෙන් ලියාපදිංචි මෝදර ලසාලියානු වෘත්තීය අධ්‍යාපන ආයතනයට 2015 වසර සඳහා සිසුන් බඳවා ගැනීම.

| *අංකය* | *පාඨමාලාවේ නම* | *කාලය* |
|---|---|---|
| 1 | විදුලි ශිල්පය | අවුරුදු 01 |
| 2 | පෑස්සුම් ශිල්පය | අවුරුදු 01 |
| 3 | ඇඳුම් මැසීම I | අවුරුදු 01 |
| 4 | ඇඳුම් මැසීම II | මාස 06 |
| 5 | එම්බ්‍රෝයිඩර් | මාස 06 |
| 6 | රූපලාවන්‍ය | මාස 06 |
| 7 | සූපවේදී ශිල්පය | මාස 06 |
| 8 | කේක් සෑදීම | මාස 06 |

*පුහුණුව සමඟ ඔබට :*

01. NVQ සහතිකය සඳහා යොමු කිරීම,
02. උපදේශන සේවා,
03. නේවාසික පහසුකම් ද සමඟ තවත් පහසුකම් රැසක්.

*පුහුණුවෙන් පසු :*

01. දේශීය හෝ විදේශීය රැකියාවකට යොමු කිරීම,
02. උසස් වටිනා කමකින් යුත් වෘත්තීය සහතිකයක්,
03. දීමනාවක් සමඟ වැඩිදුර පුහුණු අවස්ථා.

ඉහත විස්තර අනුව ඔබ කැමති පාඨමාලාවක් හැදෑරීම සඳහා ඔබේ සුදුසුකම් ද සමඟ දුරකථන අංකය ද සඳහන් කර ඔබ විසින්ම සකසාගත් අයදුම්පත්‍රයක් 2014.12.31 දිනට පෙර පහත සඳහන් ලිපිනයට යොමු කරන්න. නැතහොත් පැමිණ බාර දෙන්න.

*විමසීම :-*

ලසාලියන් වෘත්තීය අධ්‍යාපන ආයතනය,
අංක 51, කෝවිල පාර,
මෝදර,
කොළඹ 15.

දුරකථන අංකය : 011 2523912

12-203

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

***සියලුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.***

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල *රු. ශ.* | තැපැල් ගාස්තුව *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනිපිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සලකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2014** | | | |
| දෙසැම්බර් | 2014.12.05 | සිකුරාදා | 2014.11.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.12.12 | සිකුරාදා | 2014.11.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.12.19 | සිකුරාදා | 2014.12.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.12.26 | සිකුරාදා | 2014.12.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| | | | **2015** | | | |
| ජනවාරි | 2015.01.02 | සිකුරාදා | 2014.12.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.01.09 | සිකුරාදා | 2014.12.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.01.16 | සිකුරාදා | 2015.01.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.01.23 | සිකුරාදා | 2015.01.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.01.30 | සිකුරාදා | 2015.01.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| පෙබරවාරි | 2015.02.06 | සිකුරාදා | 2015.01.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.02.13 | සිකුරාදා | 2015.01.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.02.20 | සිකුරාදා | 2015.02.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.02.27 | සිකුරාදා | 2015.02.13 | සිකුරාදා | දහවල් | 12.00 |

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2014 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.